

අංක 7

071 - 8431807

සමන්ත රණසිංහ

Samantha Ranasinghe

උඩුගම, පත්තම්පිටිය, රඹුක්කන යන ලිපිනයේ පදිංචි සමන්ත රණසිංහ සහෝදරයා කෑ/මාව උඩුගම කණිෂ්ට විද්‍යාලය සහ කෑ/මාව අශෝක මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා කෑ/මාව පින්නවල මධ්‍ය මහා විද්‍යාලයේ විද්‍යා අංශයෙන් අ.පොස. උසස් පෙළ සමත්ව සියනෑ ජාතික අධ්‍යාපන පීඨයෙන් ඩිප්ලෝමා ධාරියෙකු ලෙස ගුරු සේවයට එක්ව විදුහල්පති වරයෙකු ලෙස සේවය කර ඇත. ජාතික තලයේ වෘත්තීය සමිති නායකයෙකු හා ලංකා ගුරු සේවා සංගමයේ සබරගමු පළාත් ලේකම්වරයාද වේ. රඹුක්කන ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රී වරයෙකු ලෙසද විශාල සේවයක් කර ඇති අයෙකි.

ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු හා රඹුක්කන ආසනයේ ප්‍රධාන සංවිධායක වරයා ලෙස ද කටයුතු කරයි. වසර 24 ක දේශපාලන අත්දැකීම් සහිත මානව හිතවාදී පුද්ගලයෙකු වන මොහු පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකු ලෙස තෝරා පත්කර ගනිමු.



අංක 10

071-831 63 98

කංචන වැලිපිටිය

Kanchana Welipitiya

කංචන වැලිපිටිය සහෝදරයා, කෑ/ගලිගමුව මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරීමෙන් පසුව ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ කාලීන දේශපාලනයට පිවිස එහි සමාජවාදී ශිෂ්‍ය සංගමයේ දිස්ත්‍රික් සංවිධායක වරයා ලෙසත්, සමාජවාදී තරුණ සංගමයේ දිස්ත්‍රික් සංවිධායක වරයා ලෙසත් කටයුතු කර ඇත. තවද ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙසද තේරී පත්විය.

එමෙන්ම ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු හා ගලිගමුව ආසනයේ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කරයි.

දශක තුනක ආසන්න කාලයක් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ දේශපාලන කටයුතු වල නියැලෙමින් පොදු ජනතාවගේ ආදරය දිනාගත් තරුණ නායකයෙකු ලෙස මෙවර පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත් කර යවමු.



අංක 8

076 - 083 50 66

මනෝජ් රාජපක්ෂ

Mano Rajapaksha

මනෝජ් රාජපක්ෂ සහෝදරයා කෑ/ බෝධිරාජ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබ පසුව කෑ/ තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලයෙන් ගණිත අංශයෙන් උසස් පෙළ සමත්ව මොරටුව විශ්වවිද්‍යාලයෙන් රෙදිපිළි ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය හදාරා පෞද්ගලික ආයතන කිහිපයක විධායක නිළධාරියෙකු ලෙස සේවය කර ඇත.

ඉන් අනතුරුව ජනතා විමුක්ති පෙරමුණේ වසර 24 ක පූර්ණ කාලීන දේශපාලන කටයුතු වල නිරත වෙමින් එහි තරුණ අංශයේත්, අධ්‍යාපන අංශයේත් කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කරන ලදී. ඊට අමතර වරකාපොල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස වසර ගණනාවක් කටයුතු කර ඇත. ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු හා දැදිගම ආසනයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස කටයුතු කරයි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජනාදරයට පත් මනෝ සහෝදරයා මෙවර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරාපත් කර යවමු.



අංක 11

071 - 452 48 98

කෝසල ජයවීර

Kosala Jayaweera

ගුරුගල්ල කනිෂ්ඨ විද්‍යාලයේ හා ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය හදාරා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයෙන් උසස් අධ්‍යාපනය හැදෑරූ කෝසල සහෝදරයා විවෘත විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වශයෙන් කටයුතු කළ අතර සමාජවාදී ශිෂ්‍ය සංගමයෙන් (SSU) ජාතික දේශපාලනයට පැමිණ එහි ජාතික කමිටු සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇත.

ජනතා විමුක්ති පෙරමුණේ දෙහිඕවිට හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වශයෙන්ද ,කෑගල්ල දිස්ත්‍රික් තරුණයට නායකත්වය දෙමින් වර්තමානයේ සමාජවාදී තරුණ සංගමයේ (SYU, NPP youth) කෑගල්ල දිස්ත්‍රික් සංවිධායක වරයා වන අතර ඔහු ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභික, රුවන්වැල්ල ආසනයේ සංවිධායක වරයාවේ. වසර 12කට වැඩි දේශපාලන අත්දැකීම් සහිත දක්ෂ නිර්මාණශීලී තරුණ, මානව හිතවාදී නායකයකු වන කෝසල සහෝදරයාව මෙවර පාර්ලිමේන්තුවට පත් කර ගනිමු.



අංක 9

071-8001631


සනත් පතිරණ

Sanath pathirana

කෑගල්ල, නිල්වක්ක ප්‍රදේශයේ පදිංචි සනත් පතිරණ සහෝදරයා කෑ/කුරුදුගින්න කණිෂ්ට විද්‍යාලය, කෑ/ වළගම්බා කණිෂ්ට විද්‍යාලය හා රංවල මහානාග මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයට ඇතුළත්ව විද්‍යාවේදී (ව්‍යාපාර අධ්‍යයනය) උපාධිය ලබාගෙන ඇත. 1999 යේ රාජ්‍ය සේවයට එක්වන ඔහු වසර 24 ක් කීර්තිමත් රාජ්‍ය සේවයක් ඉටුකොට 2022 වසරේ විශ්‍රාම ගනී.

ජාතික ජන බලවේගය ගොඩනැගීමේදී දේශපාලන පක්ෂයක් ලෙස එකතු වූ වාමාංශික එක්සත් බලවේගයේ නියෝජ්‍ය ලේකම් ලෙසත් ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු ලෙස ප්‍රදේශයේ විවිධ ගැටලු සඳහා විසඳුම් ලබාදීමට ක්‍රියාකාර්ව මැදිහත් වූ සමාජ ක්‍රියාදරයෙකි.

2024 වර්ෂයේ නව පාර්ලිමේන්තුවට කෑගල්ලෙන් මොහු තෝරා පත්කර ගනිමු.



ජාතික ජන බලවේගය

தேசிய மக்கள் சக்தி

JATHIKA JANA BALAWEGAYA (NPP)



ගෞරවණීය ස්වාමීන් වහන්ස, පූජකතුමනි,
ආදරණීය මවුවරුනි, පියවරුනි,
සහෝදර, සහෝදරියනි, දූ දරුවනි,

පසුගිය ජනාධිපතිවරණයේදී අපි, රටට ශාපයක්ව පැවති ප්‍රභූ දේශපාලනයට අභියෝග කර එය තීරණාත්මකව පරාජය කිරීමේ පළමු පියවර තැබුවෙමු. එම ජයග්‍රහණය සමඟ සදාචාරසම්පන්න නව දේශපාලන සංස්කෘතියක් කරා අප ගමන් කරමින් සිටිමු. ආර්ථිකය මැනවින් කළමනාකරණය කරමින් සාධනීය ජයග්‍රහණ ලබමින් සිටිමු. ලොව පුරා රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ විශ්වාසය දිනා ගනිමින්, ජාත්‍යන්තර සම්බන්ධතා ශක්තිමත් කර ගනිමින් සිටිමු.

ඉන් නොනැවතී, අප රට පොහොසත් රටක් බවට පත් කර ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනංවා ඔබට ලස්සන ජීවිතයක් ලබා දීමට අප විසින් තවත් දහසකුත් එකක් කාර්යයන් කිරීමට අදිටන් කරගෙන සිටිමු. දැන් අප ඉදිරියේ ඇත්තේ, ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය, ව්‍යවස්ථානුකූල බලයකින් බල ගන්වා, ඔබ වෙනුවෙන් වැඩ කිරීමට ශක්තිමත් පාර්ලිමේන්තු කණ්ඩායමක් තෝරා ගැනීමේ තීරණාත්මක මොහොතකයි.

සිත් තුළ දරාගත්, නොනැසී පැවති සිහින සැබෑ කර ගැනීම වෙනුවෙන් චෙතිහාසිකව ඔබ ජනාධිපතිවරණයේදී ඉටු කළ යුතුකම, ස්ථිරසාර වූවක් බවට පත් කරමු. ඒ වෙනුවෙන් මාලිමාවට ඡන්දය ලබා දී විශිෂ්ඨ, ජනතාවාදී පාර්ලිමේන්තු බලයක් ගොඩනගමු.



රට හදන අපි එකට මාලිමාවට

අංක 12

077-3436546

කෑගල්ල දිස්ත්‍රික්ක
කණ්ඩායම් නායක,

වෛද්‍ය දම්මික පටබැඳි

Dammika patabendi

අංක 861/1, අඹන්පිටිය, කෑගල්ල ලිපිනයේ පදිංචි දම්මික පටබැඳි සහෝදරයා කොළඹ ආනන්ද විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය හදාරා කොළඹ වෛද්‍ය පීඨයට ඇතුලත්ව වෛද්‍ය උපාධිය ලබා වසර කීපයක් වෛද්‍ය වරයෙකු ලෙස සේවය කර ඇත. වෛද්‍ය වෘත්තියට සමුදී ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ කාලීන දේශපාලනයට පිවිස එහි මධ්‍යම කාරක සභිකයෙකු ලෙස කටයුතු කරයි. ඊට අමතරව ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභිකයෙකු හා කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවිධායක වරයාද වේ. 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කණ්ඩායම් නායකත්වය දරමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ උගත්, බුද්ධිමත්, පරිණත නායකයෙක් ලෙස පාර්ලිමේන්තුවට තෝරා පත්කර යවමු.

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් වෙනුවෙන් මාලිමාව දිනවමු...



අංක 1

070-740 4500

නීතීඥ සාගරිකා අතාවුද

Sagarika Gangani Athauda

කෑගල්ල, සියඹලාපිටිය පදිංචි සාගරිකා අතාවුද සහෝදරිය, කෑ/ ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධියක්ද, නීති විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු වලින් පසු ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක ලෙස කටයුතු කරයි. තවද ඇය කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාධාරිනියකි.

ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු මෙන්ම ජාතික ජන බලවේගයේ ''නීතීඥයෝ'' සංවිධානයේ කෑගල්ල දිස්ත්‍රික් කමිටු සාමාජිකත්වයද කෑගල්ල දිස්ත්‍රික් කාන්තා විධායක සභාවේ සාමාජිකාවක්ද වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයෙන් උගත්, තරුණ කාන්තාවක් ලෙස ඇය තෝරා පත්කර ගනිමු.



අංක 2

076 - 22 53 458

නන්ද බණ්ඩාර

Nanda Bandara

ගිනිහප්පිටිය, හෙම්මාතගම යන ලිපිනයේ පදිංචි නන්දබණ්ඩාර සහෝදරයා අම්පාර නාමල් තලාව මහා විද්‍යාලයෙන් හා අරණායක මානදී මහා විදුහලෙන් මූලික අධ්‍යාපනය හදාරා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුලත්ව එහිදී අන්තර විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩල ක්‍රියාකාරිකයෙකු ලෙස කටයුතු කරන ලදී. අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ සේවයෙන් පසු ගුරු සේවයට එක්වී වසර 28 ක ගුරුවරයෙක් හා විදුහල්පති වරයෙක් ලෙස සේවය කරන අතර ජනතා විමුක්ති පෙරමුණේ අවස්ථා දෙකකදී ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරයෙකු ලෙස කටයුතු කර ඇත.

දැනට ජාතික ජන බලවේගයේ අරණායක ආසනයේ සංවිධායකවරයා ලෙස කටයුතු කරන අතර වසර 36 ක දේශපාලන අත්දැකීම් ඇති උගත්, බුද්ධිමත් නායකයෙකු ලෙස මෙවර පාර්ලිමේන්තුවට තෝරාපත්කර ගනිමු.



අංක 3

071 - 800 17 91

ආචාර්ය නන්දන මිල්ලගල

Nandana Millagala

2024 පාර්ලිමේන්තු මහමැතිවරණයට කෑගල්ල දිස්ත්‍රික්කයේ , යටියන්තොට ආසනය නියෝජනය කරමින් ආචාර්ය නන්දන මිල්ලගල සහෝදරයා ඉදිරිපත්ව සිටී. ගුරු වෘත්තියෙන් ආරම්භව වර්තමානය වනවිට ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ , ජ්‍යෙෂ්ඨ ආචාර්ය වරයෙක්, අංශාධිපති වරයෙක් ලෙස සේවය කරයි. ප්‍රකට සාහිත්‍යධරයෙක් මෙන්ම දේශකවරයෙක් ලෙස ද ප්‍රචලිත ය.

ජාතික ජන බලවේගයේ හා ජාතික විද්වත් සංවිධානයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙක් වන ඔහු ප්‍රතිපත්ති සම්පාදක කමිටු ගණනාවක සම්පත් දායකත්වය සපයා ඇත. නන්දන මිල්ලගල සහෝදරයා, මෙවර කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව ට තෝරාපත් කර යවමු.



අංක 4

077 - 955 84 49

අනුරාධ නුවන්

Anuradha Nuwan

ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ආසනයෙන් මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අනුරාධ නුවන් සහෝදරයා වෘත්තියෙන් ගිණුම්කරණ සහ ව්‍යාපාර අධ්‍යනය විෂය පිළිබඳ උපකාරක පන්ති ගුරුවරයෙකි. කැළණිය විශ්වවිද්‍යාලයේ අලෙවි කරණය පිළිබඳ විශේෂවේදී උපාධියත්, වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සම්පූර්ණ කර ඇත.

ශිෂ්‍ය සටන් වලින් බහුජන දේශපාලනයට පිවිසි අනුරාධ සහෝදරයා දැරණියගල ප්‍රදේශයේ ජනතා අයිතීන් කඩවන සෑම අවස්ථාවකම ඊට එරෙහිව ක්‍රියාකළේය. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී දැරණියගල ප්‍රාදේශීය සභා කණ්ඩායම් නායක ලෙසද වගකීම් ඉටුකල ඔහු කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු ලෙසද කටයුතු කරන අතර මෙවර මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට තෝරා පත්කරමු.



අංක 5

0777 - 271 688

විශ්‍රාමික මේජර් ජෙනරාල් සිසිර හේරත්

Sisira Herath

සිසිර හේරත් සහෝදරයා මාවනැල්ල, කෑ/ බලවත්ගම මහා විද්‍යාලයෙන් හා කෑ/ මයුරපාද මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා 1988 වර්ෂයේදී ශ්‍රී ලංකා යුධ හමුදාවට බැඳුනි. රට දැය වෙනුවෙන් විශිෂ්ට සේවයක නිරත වී මේජර් ජෙනරාල් වරයෙකු ලෙස විශ්‍රාම යන ලදී.

ජාතික ජන බලවේගයේ විශ්‍රාමික හමුදා සාමූහිකය ගොඩනැගීමේදී කැපී පෙනෙන කාර්ය භාරයක් කළ මොහු කෑගල්ල දිස්ත්‍රික්කයේ විශ්‍රාමික හමුදා සමූහිකයේ ප්‍රධානියාද වේ.

ජාතික ජන බලවේගයේ කෑගල්ල දිස්ත්‍රික් විධායක සභිකයෙකු ලෙසත්, මාවනැල්ල ආසනයේ සංවිධායකවරයෙකු ලෙසත් දේශපාලන කටයුතු වෙනුවෙන් කැපවූ සිසිර හේරත් සහෝදරයා මෙවර පාර්ලිමේන්තුවට තෝරා පත්කර යවමු.



අංක 6

076 - 689 47 69

අන්සාෆ් නසීර්

Anshaf Naseer

අන්සාෆ් නසීර් සහෝදරයා මාවනැල්ල සහිරා ජාතික පාසලෙන් පාසල් අධ්‍යාපනය හදාරා මේ වනවිට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයෙක් ලෙස කටයුතු කරයි. ඊට අමතරව ලබුදූව කෘෂි විද්‍යාලයෙන් කෘෂි නිෂ්පාදන සහ සැකසුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබේ. වෘත්තීයෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවන අතරතුර තරුණ සමාජ ක්‍රියාකාරිකයෙක් ලෙසද කටයුතු කරයි.

මාවනැල්ල ආසනයේ NPP Youth හි ප්‍රධාන සංවිධායක ලෙසද, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ කෑගල්ල දිස්ත්‍රික් බලමණ්ඩලයේද ක්‍රියාකාරිව කටයුතු කරන අන්සාෆ් සහෝදරයා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජන කොටස් අතර සමාජ ක්‍රියාකාරී තරුණයෙක් ලෙස ප්‍රකටව ඇත. මෙවර මහ මැතිවරණයෙන් කෑගල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් අන්සාෆ් සහෝදරයා පාර්ලිමේන්තුවට පත්කරමු.